# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1665/16 - 2010 අගෝස්තු 04 වැනි බදාදා - 2010.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.–බී 4/96.

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 30 වන වගන්තිය සමඟ කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2010 ජූලි මස 30 වැනි දින,
කොළඹ,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ දී ය.

### නියෝග

1. මෙම නියෝග "2010 මසුන් (ආනයන හා අපනයන) නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පනතේ 6 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සහ 1996 නොවැම්බර් මස 07 වැනි දින අංක 948/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝග යටතේ තත්කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ධීවර මෙහෙයුම් බලපත්‍රයක් ලබානොගෙන ඇති කිසිම තැනැත්තකු විසින් ආනයනය සහ අපනයනය කිරීම සඳහා මසුන් ඇල්ලීම, මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන සහ ජලජ සම්පත් එකතු කිරීම, රැස්කිරීම සහ ඉවත් කිරීම නොකළ යුතු ය.

3. යම් නිශ්චිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන ධීවර මෙහෙයුම් බලපත්‍ර ප්‍රමාණය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

4. ධීවර මෙහෙයුම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ක්‍රියාකාරකම්වලට අදාළව ද මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති එම ක්‍රියාකාරකම්වලට අදාළව කිසිම තැනැත්තකු විසින් මුහුදු පත්ල හැරීමෙහි හෝ ශ්‍රී ලංකා ජලතීරය තුළ ට්‍රෝලර් මෙහෙයුම්වල නිරත නොවිය යුතු ය.

5. පනතේ 34 වැනි වගන්තිය ප්‍රකාරව, "විවෘත වාර" හෝ "සංවෘත වාර" සහ යම් නිශ්චිත ධීවර ප්‍රදේශයකට අදාළව ධීවර කටයුතුවල නියැලීම තහනම් කර ඇති දවසේ කාලසීමාවන් ප්‍රකාශයට පත්කරමින් අමාත්‍යවරයා විසින් දැන්වීමක් පළ කළ යුතු ය.

6. මෙම නියෝගවල I වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍ර 1, ආකෘති පත්‍ර 2, ආකෘති පත්‍ර 3, ආකෘති පත්‍ර 4, ආකෘති පත්‍ර 5, ආකෘති පත්‍ර 6, ආකෘති පත්‍ර 7 සහ ආකෘති පත්‍ර 8 යන ආකෘති පත්‍ර මේ නියෝග යටතේ II උපලේඛනයේ සඳහන් යම් නිශ්චිත වර්ගයක ධීවර බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරන යම් තැනැත්තකු විසින් භාවිත කරනු ලැබිය යුතු ය.

| | | |
|---|---|---|
| (අ) | යම් මත්ස්‍ය වර්ගයක් සන්තකයේ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය | ආකෘති පත්‍ර 1 |
| (ආ) | සන්තකයේ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා වූ බලපත්‍රයක් සඳහා | ආකෘති පත්‍ර 2 |

1A - G 13222 — 2830 (2010/08)

(ඇ) යම් මත්ස්‍ය වර්ගයක් අපනයනය කිරීම සඳහා අපනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය — ආකෘති පත්‍ර 3
(ඈ) අපනයනය කිරීම සඳහා වූ බලපත්‍රය — ආකෘති පත්‍ර 4
(ඉ) ආනයනය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය — ආකෘති පත්‍ර 5
(ඊ) ආනයනය කිරීම සඳහා වූ බලපත්‍රය — ආකෘති පත්‍ර 6
(උ) ප්‍රතිඅපනයනය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය — ආකෘති පත්‍ර 7
(ඌ) ප්‍රතිඅපනයනය කිරීම සඳහා වූ බලපත්‍රය — ආකෘති පත්‍ර 8

7. මෙම නියෝගවල -

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් 2000 අංක 4 දරන පනත මගින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"මසුන්" යන්නෙන් ජීවත්ව සිටින හෝ ජීවත් නොවන, ජලයේ වාසය කරන ඕනෑම ජලජ හෝ සමුද්‍රීය සතෙකු අදහස් වන අතර, ඊට ඔවුන්ගේ බිත්තර, පැටව්, ඇස්වටයන් සහ එම සතුන්ගේ වර්ධන අවස්ථාවන් සහ ඔවුන්ගේ කොටස් ද, එසේම එක් ස්ථානයක වාසය කරන සත්ව විශේෂවලට අයත් සියලු ජීවීන් ද ඊට ඇතුළත් වේ.

"ට්‍රෝලිං" යන්නෙන් ට්‍රෝල් දැලක් ජලාශ පතුල දිගේ යාන්ත්‍රිකව එළීමෙන් කරනු ලබන ධීවර මෙහෙයුම් අදහස් වේ.

## I වන උපලේඛනය

*ආකෘති පත්‍ර 1*

### *විකිණීම හෝ ප්‍රවාහනය සඳහා ප්‍රදර්ශන භාණ්ඩ සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :..............................................................
2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :..............................................................
3. තැපැල් ලිපිනය :..............................................................
4. විද්‍යුත් තැපැල (ඊමේල්) :..............................................................
5. දුරකථන අංකය :..............................................................
6. ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................
7. ව්‍යාපාර ලියාපදිංචි අංකය :..............................................................
8. මිලදී ගැනීමේ ස්ථාන :..............................................................
9. ප්‍රදර්ශනය කිරීමේ ස්ථාන විකිණීම / ගබඩා කිරීම :..............................................................

| *ප්‍රමාණය* | *ස්ථානය* |
|---|---|
| | |
| | |

10. ප්‍රවාහන ක්‍රමය :
    (අ) වාහන වර්ගය :..............................................................
    (ආ) වාහන අංකය :..............................................................
    (ඇ) ලියාපදිංචි අංකය :..............................................................
11. ප්‍රවාහන මාර්ගය :..............................................................
12. වෙනත් යම් විස්තර :..............................................................

ඉහත ප්‍රකාශය මගේ උපරිම දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. බලපත්‍රයේ දක්වා ඇති නියම හා කොන්දේසිවලින් සහ 2010 මසුන් (ආනයන හා අපනයන) නියෝග වලින් මා බැඳී සිටිමි.

..............................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :.............................................. .

*ආකෘති පත්‍ර 2*

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.
ශ්‍රී ලංකාව.

බලපත්‍ර අංකය :..............................

*සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම විකිණීම සඳහා*
*ප්‍රදර්ශනය විකිණීම හෝ ප්‍රවහනය සඳහා වූ බලපත්‍රය*

................................ හි පදිංචි ...................................... විකිණීම හෝ ප්‍රවාහනය විකිණීම සඳහා ප්‍රදර්ශන භාණ්ඩ සන්තකයේ තබා ගැනීමේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙයින් බලය ලබා දෙමි.

1. මේ අවසර පත්‍රය කලින් අවලංගු කරනු නොලැබුවහොත් .................................. සිට ...............................................දක්වා මාස ............................................... ක කාල සීමාවකට වලංගු විය යුතු ය.

2. මේ අවසර පත්‍රය පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු ය.

(i) මේ අවසර පත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිත කරනු ලැබිය යුතු අතර එය වෙනත් යම් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

(ii) මේ බලපත්‍රය 2010 මසුන් (ආනයනය හෝ අපනයනය) නියෝගවල විධිවිධානවලට යටත් විය යුතු ය.

(iii) එක් එක් කිලෝග්‍රෑම් එකක කිලෝග්‍රෑම් එකකට කෑලි ........................ වඩා අන්තර්ගත නොවිය යුතු ය.

(iv) ................................................................................................ දිග හෝ විෂ්කම්භය නොඉක්මවිය යුතු ය.

(v) අය කරනු ලබන ගාස්තුව කිලෝග්‍රෑම් එකකට/කෑලි එකකට/ ............................................................ කට රු. ......................................................... විය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය :................................................ .

*ආකෘති පත්‍ර 3*

*අපනයනය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය*

1. ඉල්ලුම්කරුවන්ගේ / ආයතනයේ සම්පූර්ණ නම :-.................................................................................................
2. ලිපිනය :-.................................................................................................
3. දුරකථන අංකය :-.................................................................................................
4. ෆැක්ස් අංකය :-.................................................................................................
5. විද්‍යුත් තැපැල (ඊමේල්) :-.................................................................................................
6. ව්‍යාපාර ලියාපදිංචි අංකය :-.................................................................................................
7. භාණ්ඩ තොගය පිළිබඳ විස්තර :-.................................................................................................

| වාණිජ නම | ඒකකයක (කි.ග්‍රෑම්) අඩංගු ප්‍රමාණය | මුළු බර (කි.ග්‍රෑම්) | මුළු ප්‍රමාණය | සැපයුම් / අල්ලාගත් ප්‍රදේශය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

8. කිලෝග්‍රෑමයක / කැබැල්ලක් .................................... සඳහා අය කළ හැකි ගාස්තුව රු. ................................ විය යුතු ය.
9. අපනයනය කරනු ලබන රට :-.................................................................................................
10. අමතර තොරතුරු :-.................................................................................................

ඉහත ප්‍රකශය සත්‍ය හා නිවැරදි බව මම / අපි සහතික කරමි/කරමු. මෙහි ප්‍රකාශ කර ඇති විස්තර කිසිවක් වැරදි බව පෙනී ගියහොත් ඒ විස්තර පදනම් කරගෙන නිකුත් කරන ලද මේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් වන බවට මම / අපි එකඟ වෙමි / වෙමු.

.................................................

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :..........................................................

*ආකෘති පත්‍ර 4*

*ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව*

නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

බලපත්‍ර අංකය :............................

*අපනයනය කිරීම සඳහා බලපත්‍රය*

1. පහත දැක්වෙන භාණ්ඩ තොගය අපනයනය කිරීම සඳහා .................................................................. හි පදිංචි.............................................................. ට මෙයින් බලය දෙමි.

| වර්ගය (වාණිජ නම) | ප්‍රමාණය (කි.ග්‍රෑම්/කැබලි) |
|---|---|
| | |
| | |

2. මේ බලපත්‍රය කලින් අවලංගු කරනු නොලැබුහොත් .................................. සිට ......................................... දක්වා වූ මාස ................................................................................................ කාල සීමාවකට වලංගු විය යුතු ය.

3. මේ බලපත්‍රය පහත දැක්වෙන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

   (i) මේ බලපත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිත කරනු ලැබිය යුතු අතර එය වෙනත් යම් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

   (ii) මේ බලපත්‍රය 2010 මසුන් (ආනයනය හෝ අපනයනය) නියෝගවල විධිවිධානවලට යටත් විය යුතු ය.

   (iii) සෑම කිලෝග්‍රෑම් එකකට කෑලි ............................................... කට වඩා අන්තර්ගත නොවිය යුතු ය.

   (iv) ........................................................................................ දිග හෝ විෂ්කම්භය නොඉක්මවිය යුතු ය.

4. අතිරේක නියම සහ කොන්දේසි ..............................................................................................................

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය :....................................... .

*ආකෘති පත්‍ර 5*

*ආනයනය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ / ආයතනයේ සම්පූර්ණ නම :-..........................................................................
2. ලිපිනය :-..........................................................................
3. දුරකථන අංකය :-..........................................................................
4. ෆැක්ස් අංකය :-..........................................................................
5. විද්‍යුත් තැපැල (ඊමේල්) :-..........................................................................
6. ව්‍යාපාර ලියාපදිංචි අංකය :-..........................................................................
7. භාණ්ඩ තොගය පිළිබඳ විස්තර :-..........................................................................

| වර්ගය (වාණිජ නම) | ආනයනය කළ ප්‍රමාණය | ආනයනය කළ දිනය | ආනයනය කළ රට |
|---|---|---|---|
| | | | |
| | | | |

8. කිලෝග්‍රෑමයක් / කැබැල්ලක් ...................... සඳහා අය කළ යුතු ය.
9. නැවත අපනයනය කරනු ලබන රටේ / රටවල නම් :-..........................................................................

මෙහි පහත අත්සන් කරනු ලබන මම / අපි මෙහි සඳහන් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි / කරමු. මෙහි සඳහන් කළ යුතු විස්තර සාවද්‍ය ලෙස ප්‍රකාශ වී ඇත්නම් එවැනි විස්තර සැපයීම මත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු වීමට ඉඩ ඇති බවට මම / අපි මින් එකඟ වෙමි / වෙමු.

..............................................,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :........................................... .

*ආකෘති පත්‍ර 6*

*ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව*

නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.
ශ්‍රී ලංකාව.

බලපත්‍ර අංකය :..............................

*ආනයනය කිරීම සඳහා බලපත්‍රය*

1. ............................................. හි පදිංචි ............................................. යන අයට, පහත සඳහන් ප්‍රමාණය ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සඳහා මෙයින් අවසර දෙමි.

| වර්ගය (වාණිජ නම) | ප්‍රමාණය (කි.ග්‍රෑම්/කැබලි) |
|---|---|
| | |
| | |

2. මෙම අවසර පත්‍රය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස ............................................................ දින ............................................දක්වා මාස ............................................ කාල සීමාවකට වලංගු විය යුතු ය.

(i) මෙම බලපත්‍රය එහි නම සඳහන් තැනැත්තා විසින් භාවිත කළ යුතු අතර, එය වෙනත් යම් තැනැත්තකුට පැවරිය නොහැක.

(ii) මේ බලපත්‍රය 2010 මසුන් (ආනයනය හෝ අපනයනය) නියෝගවල විධිවිධානවලට යටත් විය යුතු ය.

(iii) සෑම කිලෝග්‍රෑම් එකක් තුළම කෑලි ............................................ වඩා අන්තර්ගත නොවිය යුතු ය.

3. අදාළ වන නියම හා කොන්දේසි ............................................................................................................ .

..............................................
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය :........................................ .

ආකෘති පත්‍ර 7

### ප්‍රති අපනයනය කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය

1. ඉල්ලුම්කරුගේ / ආයතනයේ සම්පූර්ණ නම :-............................................

2. ලිපිනය :-............................................

3. දුරකථන අංකය :-............................................

4. ෆැක්ස් අංකය :-............................................

5. විද්‍යුත් තැපැල (ඊමේල්) :-............................................

6. ව්‍යාපාර ලියාපදිංචි අංකය :-............................................

7. භාණ්ඩ තොගය පිළිබඳ විස්තර :-............................................

| වර්ගය (වාණිජ නම) | ආනයනය කළ ප්‍රමාණය | ආනයනය කළ දිනය | ආනයනය කළ රට |
|---|---|---|---|
| | | | |
| | | | |

| වර්ගය (වාණිජ නම) | ප්‍රති අපනයනය කළ ප්‍රමාණය | ප්‍රති අපනයනය කිරීමට යෝජිත දිනය | අමුණා ඇති ලේඛනය |
|---|---|---|---|
| | | | |
| | | | |

8. ප්‍රති අපනයනය කිරීමේ රටේ / රටවල්වල නම් :-............................................

මෙහි පහත අත්සන් කරනු ලබන මම / අපි මෙහි සඳහන් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි / කරමු. මෙහි සඳහන් කළ යුතු විස්තර සාවද්‍ය ලෙස ප්‍රකාශ වී ඇත්නම් එවැනි විස්තර සැපයීම මත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු වීමට ඉඩ ඇති බවට මම / අපි මින් එකඟ වෙමි / වෙමු.

............................................ ,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :............................................ .

*ආකෘති පත්‍ර 8*

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

*ප්‍රති අපනයනය කිරීම සඳහා වූ බලපත්‍රය*

1. ........................................................................................................................ හි පදිංචි.................................................................... යන අයට, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද.......................................................... අපනයනය කිරීම සඳහා මෙයින් බලය පවරමි.

| *වර්ගය (වාණිජ නම)* | *ප්‍රමාණය* |
|---|---|
| | |
| | |

2. මෙම බලපත්‍රය කලින් අවලංගු කරනු ලැබුහොත් මිස .......................................................... දක්වා වලංගු විය යුතු ය.

(i) මෙම බලපත්‍රය මෙහි නම් සඳහන් හිමිකරුට පෞද්ගලික වන අතර අන් අයකුට මාරු කළ නොහැකි ය.

(ii) මේ බලපත්‍රය 2010 මසුන් (ආනයනය හෝ අපනයනය) නියෝගවල විධිවිධානවලට යටත් විය යුතු ය.

(iii) ..........................................කිලෝග්‍රෑම් එකක .......................................... සංඛ්‍යාවකට වඩා අන්තර්ගත නොවිය යුතු ය.

(iv) ...................................................................................... දිග හෝ විෂ්කම්භය නොඉක්මවිය යුතු ය.

3. අදාළ නියම හා කොන්දේසි ........................................................................................ .

..........................................................................

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය :......................................... .

II වන උපලේඛනය

මුහුදු කුඩැල්ලන් බලපත්‍ර

1. මුහුදු කුඩැල්ලන් යන්නෙන් හොලොතුරොයිඩියා පන්තියට අයත් මුහුදු කුඩැල්ලන් විශේෂ අදහස් වේ.

2. බලපත්‍රයක් අවශ්‍ය වන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි විය යුතු ය. අසම්පූර්ණ ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(1) තම්බා වියලන ලද (පිරිසැකසුම් කළ) මුහුදු කුඩැල්ලන් අපනයනය කිරීම සඳහා වූ ඉල්ලීම (ආකෘති පත්‍ර 3)

(2) තම්බා වියලන ලද (පිරිසැකසුම් කළ) මුහුදු කුඩැල්ලන් අපනයනය කිරීම සඳහා වූ බලපත්‍රය (ආකෘති පත්‍ර 4)

3. 1 වැනි උපලේඛනයේ 2 වන ආකෘති පත්‍රය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මාස හයක කාලයක් සඳහා වලංගු විය යුතු ය. කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, ජනවාරි මස 1 වැනි දින සහ ජූලි මස 1 වැනි දින ආරම්භ කරනු ලැබේ. නිකුත් කරන ලද බලපත්‍රයක් එහි සඳහන් කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

4. මුහුදු කුඩැල්ලන් කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් දෙකක ගාස්තුවක් අයකළ යුතු ය. තම්බා වියලන ලද (පිරිසැකසුම් කළ) මුහුදු කුඩැල්ලන් අපනයනය කිරීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කරන විට මෙම මුදල ගෙවනු ලැබිය යුතු ය.

08-446

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.